7.12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලවේ		
7.12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලනොවේ	මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇත.	නීතිපති උපදෙස් ලබා ගැනීම. පළාත් සභා ශේෂ මාසිකව නිරවුල් කිරීම.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වයන් (අනුකූලවේ/ නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
7.13	**පොදු තැම්පත් ගිණුම**			
7.13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලනොවේ	ඇතැම් විගණන විමසුම් සිදුවන බැවින් තවදුරටත් රඳවා ගෙන තිබේ.	මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම.
7.13.2	පොදු තැම්පත් සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
7.14	**අග්‍රිම ගිණුම**			
7.14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
7.14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
7.14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
7.14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වයන් (අනුකූලවේ/ නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
7.15	**ආදායම් ගිණුම**			
7.15.1	දාල රෙගුලාසි වලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූලවේ		
7.15.2	රැස්කළ තිබූ ආදායම් තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූලවේ		
7.15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7.16	**මානව සම්පත් කළමනාකරණය**			
7.16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
7.16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
7.16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වයන් (අනුකූලවේ/ නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
7.17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
7.17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
7.17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
7.17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7.18	**පුරවැසි ප්‍රඥප්තියේ ක්‍රියාත්මක කිරීම**			
7.18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		
7.18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වයන් (අනුකූලවේ/ නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ ක්‍රියාමාර්ග
7.19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
7.19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
7.19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
7.19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
7.19.3	ඉහත සඳහන් චක්‍රලේඛනයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
7.19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම	අනුකූලවේ		
7.20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
7.20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරැදි කොට තිබීම	අනුකූලනෙවේ		විගණන කළමනාකරණ කමිටු වෙත අදාළ ගැටලු යොමු කිරීම.

(1113)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

CA.

මගේ අංකය எனது இல. My No. } UPCG/MG/A/DSM/MGTR/2024/09 ඔබේ අංකය உமது இல. Your No. } 16 MAY 2025 දිනය திகதி Date } 2025 මැයි 09 දින

19 MAY 2025

ගණන්දීමේ නිළධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.

යටෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙතද දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු තිබේ නම් ඒ බව ද, මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

බී.ජී. අසේල ඉඳුනිල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (උඟව පළාත)
විගණකාධිපති වෙනුවට

පිටපත 1 ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා - කා.දැ.ස
2. ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

මගේ අංකය எனது இல. My No. } UPCG/MG/A/DSM/MGTR/2024/09 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2025 මැයි ෙ෭ දින

දිස්ත්‍රික් ලේකම්,
මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශීර්ෂය 277- මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් අපහරණය කිරීම මඟින් උපයාගෙන තිබූ රු.1,856,750 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු වුව ද, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.	වත්කම් අපහරණ ආදායම ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ගිණුම්ගත කළ යුතුය.	පිළිගනිමි වත්කම් අපහරණ ආදායම් ඉදිරි වර්ෂයන්හිදි ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්වීමට කටයුතු කරන බව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂය තුල මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ හැකියා වර්ධනය වෙනුවෙන් දරන ලද රු.55,947,116 ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු වුව ද, එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමේ සහ හැකියා වර්ධනය වෙනුවෙන් දරන වියදම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කල යුතුය.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ඒසීඒ - එෆ් ආකෘතියෙහිද මෙම වියදම් මූලධන වියදම් යටතේ දක්විය යුතු බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා ඇති බව.

(ඇ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු. 22,550,000 ක වටිනාකමකින් යුතු ට්‍රැක්ටර් 10 ක් සහ ට්‍රැක්ටර් බවුසර් 10 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලුම වත්කම් ගිණුම්ගත කල යුතුය.	දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාල යතුව පවතින අතර පිළිබඳ තහවුරු වාර්තාවක් ලබාගෙන වටිනාකම් 2025 ගිණුම් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව.

(ii)	බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම්වලට අදාළව ඉදිරිපත් කර තිබූ වැඩ අවසන් බිල්පත් අනුව එම ගොඩනැගිලි ඉදිකිරීම්වල වටිනාකම රු.210,929,789 ක් වුව ද ගොඩනැගිලි යටතේ රු.190,478,990 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.20,450,779 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාල අවසන් බිල්පත් වටිනාකම ගිණුම්ගත කල යුතුය.	මෙම ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසුකරු විසින් ලබා දී ඇති වට්ටම සහ ව්‍යාපෘතිය නිම කර කොන්ත්‍රාත්කරු වෙත නැවත භාරදිය යුතු භාණ්ඩ වටිනාකම ද අඩු කල පසු අගය සඳහා පමණක් බිල්පත් මගින් ගෙවා ඇති අතර, එම ගෙවීම් සිදු කළ සත්‍ය අගය පමණක් වත්කම් තුල ඇතුලත් කර ඇති බව.
(iii)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර තිබූ රු.1,759,179 ක් වන ගොඩනැගිල්ලක වටිනාකම 9151 සංකේත අංකය යටතේ ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කල යුතු වුව ද, එසේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ වටිනාකම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කල යුතුය.	පැවති ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ඇති අතර, සම්පූර්ණ ඒකකයම නැවත තක්සේරු කොට එම අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.
(iv)	තණමල්විල සහ වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ගොඩනැගිලි 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කල යුතුය.	ගොඩනැගිලි තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර තවමත් තක්සේරු ක්‍රියාවලියට ලක්වී නොමැති බව.

(v)	2013 වර්ෂයේ ලබාගත් තක්සේරු වාර්තා අනුව මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.5,251,000 ක වටිනාකමක් සහිත ගොඩනැගිලි 05ක් විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විට අබලන් තත්වයට පත්වීම හේතුවෙන් භාවිතයට නොගෙන අතහැර දමා තිබුණ ද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීමට කටයුතු නොකිරීම නිසා මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	අබලන් තත්වයේ පවතින ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කල යුතුය.	ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව
(vi)	ජාතික ආපදා කළමනාකරණ ඒකකයට අයත් අංක WP LL 4215 දරන රු.7,200,000 ක මෝටර් ලොරි රථය සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 43-3019 දරන රු.400,000 ක ජල බවුසරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.7,600,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.	වෙනත් ආයතනවලට අයත් වාහන ආපසු භාර දීමට හෝ පවරා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කල යුතුය.	අංක WP LL-4215 දරණ බවුසර් රථය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ උපදෙස් අනුව ඉදිරියේදී මොනරාගල ප්‍රාදේශිය සභාව වෙත පවරා දී වත්කම් වලින් ඉවත් කිරීමට සහ 43-3019 අංක දරණ බවුසර් රථය දැනට භාවිතයට ගත නොහැකි තත්වයේ පවතින බැවින් උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙතින් පවරාගෙන විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කරන බව.
(vii)	සමාලෝචිත වර්ෂය තුල දී අපහරණය කරන ලද රු.800,000 ක වටිනාකමක් සහිත ලොරි රථයක් සහ ලොරි බවුසර් රථයක් මූල්‍ය නොවන වත්කම් වටිනාකමින් අඩු කර දක්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	අපහරණය කල වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කල යුතුය.	අංක 43-3090 දරණ මෝටර් ලොරි රථය හා 43-3028 ලොරි බවුසර් රථ වටිනාකම 2025 ගිණුම් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව.

(viii)	බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි දෙකෙහි ඉදි කිරීම් කටයුතු අවසන් වී නොමැති වීම හේතුවෙන් එම ගොඩනැගිලි සඳහා මෙතෙක් දරා ඇති රු.411,869,721 ක වියදම ගිණුම්ගත කල යුත්තේ කෙරීගෙන යන වැඩ යටතේ (WIP-9160) වුව ද එසේ කටයුතු නොකර 9151 යටතේ වැඩ නිම ගොඩනැගිලි ලෙස ගොඩනැගිලි වටිනාකමට එකතු කර දැක්වීම හේතුවෙන් එම ගොඩනැගිලි භාවිතා කල හැකි තත්ත්වයේ නොපැවතිය දී ඒවා භාවිතා කල හැකි ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණි.	භාවිතා කල හැකි තත්ත්වයේ නොමැති නොනිමි ගොඩනැගිලිවල ඉදිකිරීම් වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු ය.	නව ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කරන අවස්ථාවන්හිදී WIP-9160 (කෙරීගෙන යන වැඩ) ක්ෂේත්‍රය යටතේ ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.
(ix)	බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළව බැරකම් යටතේ දක්වා තිබූ බිල්පත් වටිනාකම වූ රු.12,805,946 ක් ආරම්භක ශේෂයට ගැළපිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ එකතු කිරීම් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ගොඩනැගිලිවල (9151) ආරම්භක ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉකුත් වර්ෂයට අදාලව දරා ඇති වියදම් ආරම්භක ශේෂයට ගැලපුම් කල යුතුය.	එම වටිනාකම් සිගාස් පද්ධතියේදී එකතු කල හැකි වන්නේ ගෙවීම් සිදු කරන වර්ෂයට අදාලව වන බැවින් මෙම අගය එකතු කිරීම් යටතේ ගිණුම් ගත කර ඇති බව.
(x)	බිබිල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීමට අදාලව වැය ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ රු.190,478,990 ක වියදම භාණ්ඩාගාර මුද්‍රිත SA 82 හි රු.36,148,836 ක් මිල දී ගැනීම් යටතේ සහ ඉතිරි රු.154,330,154 ක වටිනාකම ආරම්භක ශේෂයට ගැලපීම් යටතේ සදොස් ලෙස ස්ථාන දෙකක ගිණුම්ගත කර තිබුණි.	ගොඩනැගිලි ඉදිකිරීමට අදාලව සමාලෝචිත වර්ෂයේ දරන ලද මුළු වියදම වර්ෂයේ එකතු කිරීම් ලෙස ගිණුම්ගත කල යුතුය.	සිගාස් පද්ධතියට ඇතුලත් කිරීමේදී ප්‍රමාද දෝෂයකින් මෙය මිලදී ගැනීම් යටතේ ඇතුලත් කර ඇති අතර, එය නිවැරදි කිරීම සඳහා මිලදී ගැනීම් ඉවත් කර (Disposal) එම වටිනාකම ආරම්භක ශේෂයට එකතුකර ඇති බව.

(xi)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පරිත්‍යාග ලෙස 2018 වර්ෂයේදී ලැබුණු රු.32,895 ක් වටිනා ආසන 03 සහිත විසිත්ත කාමර පුටුවක් සහ 2018 සිට 2020 වර්ෂය දක්වා කාලය තුල ලැබී තිබූ වටිනාකම හඳුනාගෙන නොමැති වර්ග 04 කට අයත් රූපවාහිනී යන්ත්‍ර 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.	විසිත්ත කාමර ආසන 03ක් සහිත පුටුවේ වටිනාකම රු.32,985ක් ලෙස සිගාස් දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති අතර, වටිනාකම හඳුනාගෙන නොමැති රූපවාහිනී යන්ත්‍ර 04ක් නැවත තක්සේරු කර සිගාස් පද්ධතිය යටතේ ගිණුම් ගත කිරීමට පියවර ගන්නා බව.
(xii)	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව බුත්තල, බඩල්කුඹුර, බිබිල, සියඹලාණ්ඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අපහරණය කරන ලද භාණ්ඩ අතරින් CIGAS පද්ධතියට ඇතුලත් කර තිබූ භාණ්ඩ හඳුනා ගෙන ඒවා ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම අපහරණය කරන ලද භාණ්ඩවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම තුල ඇතුළත්ව තිබුණි.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් අපහරණය කල භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කල යුතුය.	කඩිනමින් මෙම අයිතමයන් හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරන මෙන් එම කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇති බව.
(xiii)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ රු.5,000 ක් වටිනා යතුරු පැදිය අපහරණය කර තිබුණ ද මූල්‍ය නොවන වත්කම් වටිනාකමින් ඉවත් කර නොමැති බවත්, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව තිබූ යතුරු පැදියේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය තුලට ඇතුලත් කර නොමැති බවත් නිරීක්ෂණය විය.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.	වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු යතුරු පැදිය 2025 ගිණුම් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට හා බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පවතින යතුරුපැදිය 2025 ගිණුම් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව.

(xiv)	ශේෂ පිරික්සුම අනුව සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත උපකරණ සංචිතයේ ශුද්ධ වැඩිවීම රු.247,804,860 ක් වුව ද දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව දේපල පිරියත උපකරණ සංචිතයේ ශුද්ධ වැඩිවීම රු.354,672,402 ක් ලෙස දැක්වීමෙන් ශේෂයන් දෙක අතර දේපල පිරියත උපකරණ සංචිතයේ වාර්ෂික ශුද්ධ වැඩිවීමේ රු.106,867,542 ක වෙනසක් නිරීක්ෂණය විය.	දේපල පිරියත උපකරණ සංචිතයේ ශුද්ධ වැඩිවීම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය.	2023 වර්ෂයේ අවසාන දිනට දේපල පිරියත උපකරණ සංචිතයේ වටිනාකම සකස් කිරීමේදී මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් දේපල පිරියත උපකරණ සංචිතයේ වටිනාකම ගිණුම්ගත නොවීමෙන් සිදු වූ අගය අඩුවීම, නිවැරදි කිරීම බව.

(ඇ) වෙනත් අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය ව්‍යාපෘතියට අදාලව 2015 වර්ෂයේ දී ප්‍රතිලාභියෙකු වෙත රු.850,000 ක් වැඩිපුර ගෙවීම මත සිදුව තිබූ පාඩුව හානි පාඩු ලේඛනයේ සටහන් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	හානි හා පාඩු නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය.	ඉදිරියේදී මේ සම්බන්ධව පරීක්ෂාවක් සිදු කර ඉදිරි කටයුතු කරන බව

(ඉ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව කටයුතු කල යුතුය.	ඉදිරියේදී මෙම වාර්තාවල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
(ii)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව කටයුතු කල යුතුය.	විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව.

(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **XIX** වැනි පරිච්ඡේදයේ **6.1** වගන්තිය	-	2025 ජනවාරි 30 දින වන විටත් ගිවිසුම් කාල සීමාව අවසන් වී තිබූ නිවාස 08 ක් නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරා නොගැනීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දක්වා පොරොත්තු ලේඛනයේ සිටින රාජ්‍ය නිලධාරීන් අතරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට රජයේ නිවසක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	ගිවිසුම් කාලය අවසන් වී ඇති රජයේ නිවාස පවරාගෙන පොරොත්තු ලේඛනය අනුව ඉල්ලුම්කරුවන්ට ලබාදිය යුතුය.	මෙම නිල නිවාස 08න් 05ක් සේවා අවශ්‍යතාවයන් මත කාලය දීර්ඝ කර ලබා දී ඇති අතර, එක් නිල නිවාසයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී ඇති ඇත. නිල නිවාස 02ක් නැවත භාර දෙන ලෙස අදාළ නිලධාරීන් හට දන්වා ඇති බව.
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	මුදල් රෙගුලාසි 94(2)	989,327	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.	වාර්ෂික අයවැය මඟින් වෙන් කල ප්‍රතිපාදන සීමාව තුල කටයුතු කල යුතුය.	ඉදිරියේදී මෙවැනි වියදම් අවම කර ගැනීමට කටයුතු කරන බව.

මුදල් රෙගුලාසි 104 (1) (අ)	-	LG – 2045 දරණ බවුසර් රථයේ බැටරිය අස්ථානගත වී ඇති බව එහි රියදුරු විසින් 2023 ඔක්තෝබර් 27 දින දැනුම් දී තිබුණි. පරීක්ෂණ කම්ටුවක් පත් කිරීම 2024 අගෝස්තු 09 දින දක්වා ප්‍රමාද වී තිබුණද, විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විටත් එම පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. අස්ථානගත වූ බැටරිය වෙනුවට 2024 දෙසැම්බර් 30 දින රු.71,862 ක් වැය කර නැවත බැටරියක් මිලදී ගෙන තිබුණි	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා දිය යුතුය.	මූලික පරීක්ෂණය සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලය පත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දුන් අතර 2024 වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් බැටරියක් මිලදී ගැනීම සිදුකරන ලද බව.
මුදල් රෙගුලාසි 104 (3)	-	RD- 7289 හා RF– 1040 දරන ට්‍රැක්ටර් රථ දෙකෙහි බැටරි දෙක 2023 සැප්තැම්බර් 01 දින අස්ථානගත වී තිබූ අතර, පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද, විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා දිය යුතුය.	පරීක්ෂණ මණ්ඩලය වෙත වාර්තාව ලබා දීම සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.
		2023 අගෝස්තු 23 දින KJ – 3894 වාහනයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් 2023 ඔක්තෝබර් 30 දින පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද, 2025 ජනවාරි 30 දිනය වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා දිය යුතුය.	පරීක්ෂණ මණ්ඩලය වෙත වාර්තාව ලබා දීම සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.

මුදල් රෙගුලාසි 104 (4)	2016 සිට 2024 දක්වා වාර්තා වූ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2025 ජනවාරි 30 දින වන විටත් අදාල පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා දිය යුතුය.	PD 9008 අංක දරණ වාහනය සම්බන්ධයෙන් ඉදිරියේදී නව කමිටුවක් පත් කර වාර්තාව ලබා ගැනීමට අපේක්ෂිත බව. PF 8153 හා KJ 3894 අංක දරණ වාහන සම්බන්ධයෙන් වාර්තාව කඩිනමින් ලබා දෙන ලෙසට සිහිකැඳවීම් ලිපි යොමු කරන ලද බව. PC 3843 හා PA 4946 අංක දරණ වාහන සම්බන්ධයෙන් ඉදිරියේදී කමිටුවක් පත් කර වාර්තා ලබා ගැනීමට අපේක්ෂිත බව.
	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක UP–PD-9008 දරණ කැබරථය 2020 නොවැම්බර් මස 11 වන දින අනතුරට පත්වී තිබුණද, අවසන් පරීක්ෂණය විගණන දිනය වන 2024 නොවැම්බර් 29 වන දින වන විටත් සිදුකර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ලබා දිය යුතුය.	පරීක්ෂණ මණ්ඩලය වෙත වාර්තාව ලබා දීම සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.

	2023 ඔක්තොම්බර් 17 වන දින අකුණු සැර වැදීම හේතුවෙන් මොනරාගල ප්‍රාදේශීය ලේකම් නිල කාමරයට හානි සිදු වීමේ සිද්ධිය සම්බන්ධයෙන් 2025 ජනවාරි 30 දින වන විටත් පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.	විධිමත් පරිදි පරීක්ෂණ මණ්ඩලයක් පත්කර කඩිනමින් පරීක්ෂණ කටයුතු සිදුකර වාර්තා ලබා දිය යුතුය.	පරීක්ෂණ මණ්ඩලය වෙත වාර්තාව ලබා දීම සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව.
මුදල් රෙගුලාසි 128 (1) (ඉ) -	2023 වර්ෂයට අදාලව මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයට අදාල වාර්තාව මඟින් ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ භාණ්ඩ වර්ග 13 කට අයත් ඒකක 28 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති භාණ්ඩ වර්ග 02කට අයත් ඒකක 31 ක ඌනතාවයක් පවතින බවට වාර්තා කර තිබුණු අතර භාණ්ඩ නොමැතිවීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එකී භාණ්ඩවල ප්‍රතිසම්පාදන වටිනාකම අයකර ගැනීමටත්, භාණ්ඩ ඌනතාවයට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් විගණන දිනය වූ 2025 ජනවාරි 13 දින වන විටත් කටයුතු කර නොමැති බවට නිරීක්ෂණය විය.	භාණ්ඩ ඌනතා සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදුව ඇති පාඩුව ඔවුන්ගෙන් අයකර ගත යුතුය.	ප්‍රාදේශීය ලේකම් ජී.යූ.කේ.අල්ගේ වත්තගේ මහතා 2018.10.07 දින ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට ස්ථාන මාරු ලබා ඇත. නමුත් ඔහු විසින් නිල නිවාසය හා එම භාණ්ඩ විධිමත්ම භාරදීමකින් තොරව නිල නිවාසයේ යතුර පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවා ඇත. හිඟ භාණ්ඩ පිළිබඳව ජී.යූ.කේ.අල්ගේ වත්තගේ මහතා ද දැනුවත් කර ඇති නමුත් ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැති බව.

(iii)	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2020 මැයි 20 දිනැති අංක 2020/6 චක්‍රලේඛයේ 1.1 ඡේදය	25,680,769	වාර්ෂික බදු මුදල කාර්තුමය පදනමින් අයකල යුතු බව දන්වා තිබුණද, දීර්ඝකාලීන බදු බලපත්‍ර අංක 4/10/37266, 4/10/37611 සහ 4/10/19826 සම්බන්ධයෙන් බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම නිර්දේශය අනුව කටයුතු කර නොතිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දිනට බදු ආදායම් හිඟහිටිව පැවතුණි.	රජයට ලැබිය යුතු ආදායම් කඩිනමින් අප්‍රමාදව අයකර ගතයුතුය.	බදුකරයන් දෙකක් සඳහා හිඟ බදු ගෙවීමට බදුකරුවන් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් සහන කාලයක් ඉල්ලා ඇත. එක් බදුකරුවෙකු මිය ගොස් ඇති බැවින් හිඟ බදු කපා හැරීම ඉල්ලීම් කර ඇති බව.
(iv)	අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛය	-	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිළධාරීන්ගේ විස්තර ඇතුළත් කර ඇප තැන්පතු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීව පවත්වාගෙන යා යුතුය.	කඩිනමින් ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.
(v)	2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය	-	බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි සිගාස් ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.	බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි සිගාස් ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කල යුතු ය.	බැඳීම් හා බැරකම් සිගාස් පද්ධතියට ඇතුලත් කිරීමට නොහැකි වූයේ ගිණුම් පියවන අවස්ථාව වන විට ඒ සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම නිසා බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම,ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා දී තිබූ ප්‍රතිපාදනවලින් වැය විෂයයන් 18 කට අදාළව රු.76,402,788 ක් ඉතිරි වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 52 දක්වා පරාසයක විය.	ප්‍රතිපාදන ඉතිරිවීම් අවම වන පරිදි අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.	ඉදිරි වර්ෂයන්හිදී අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂයය සඳහා රු.250,000,000 ක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, දෙසැම්බර් 31 දිනට එම වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරිවීම රු.59,521,009 ක් වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක් විය. බිබිල සහ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු නිම කිරීමට සමාලෝචිත වර්ෂය තුල දී ද නොහැකි වී තිබුණි. නිසි කළමනාකරණයකින් යුතුව එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා මෙම ප්‍රතිපාදන කාර්යක්ෂමව භාවිතයට නොගැනීම මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය.	ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා වෙන්කල ප්‍රතිපාදන ඉතිරි නොවන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් නිම කිරීම සඳහා කාර්යක්ෂමව කටයුතු කල යුතුය.	මේ සඳහා අදාළ වන ප්‍රතිපාදන ප්‍රමාණය 2025 වර්ෂය සඳහා අවිච්ඡේද කොට ලබා ගෙන ඇති අතර 2025 වර්ෂය තුල මෙම කාර්යය අවසන් කිරීමට කටයුතු කරන බව.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂය සඳහා ඇමුණුම් (iv) යටතේ ඉදිරිපත් කර තිබුණු බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) හි මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව එළඹ තිබූ සියලු බැදීම් හෙළිදරව් කළ යුතු වුව ද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැරකම් ලේඛනයේ ඇතුළත් කර තිබූ වැය විෂයයන් 03කට අයත් රු.549,133 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	වර්ෂයට අදාල සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කල යුතුය.	ඉදිරි වර්ෂයන්හිදී මූල්‍ය ප්‍රකාශන තුල බැරකම් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කරන බව.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය සංවර්ධන ව්‍යාපෘතියට අදාලව ඉඩම් අත්පත්කර ගැනීම් සහ වන්දි ගෙවීම් වලට අදාලව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
	(i) ඉඩම් කට්ටි 552 ක් සඳහා රු.477,309,806 ක වන්දි මුදල් ගෙවා තිබූ අතර, එම ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් ඉඩම් කට්ටි 243 ක් සඳහා රු.33,518,353 ක් පොලී මුදල් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2012 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම්	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර පොලී මුදල් ගෙවීම අවම කල යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා විවිධ ආයතන සම්බන්ධ වන අතර ඒ හේතුවෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා විශාල කාල පරාසයක් ගත වන බැවින් වන්දි ගෙවීම් අවසන් කිරීමට වසර කිහිපයක් ගත වී ඇත. ඉදිරි වන්දි ගෙවීමේ කටයුතු

වෙනුවෙන් වන්දි ගෙවීම් වසර 12 ක් ප්‍රමාද වීම හේතුවෙන් රජයට අමතරව රු.33,518,353 ක පොලී මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.		කිරීමේ දී අදාළ ආයතන දැනුවත් කර හැකි පමණ කඩිනමින් මෙම කාර්ය නිම කිරීමට බලාපොරොත්තු වන බව.
(ii) අංක 296,297,301 හා 303 යන ඉඩම් කැබලි සඳහා වන්දි ඉල්ලීමේදී ඉඩම් හිමියන් වසර ගණනාවක් පැරණි ඔප්පු, පත්ඉරු ලබාදීම හේතුවෙන් සින්නක්කර අයිතියට හිමි අගයන් තක්සේරු කර තිබුණි. මිනින්දෝරු වාර්තා අනුව ඒවා රජයේ ඉඩම් ලෙස සනාථ වීමත් සමඟ රු.11,710,500 ක් පැවති මුල් වන්දි මුදල, සංවර්ධන වටිනාකම දක්වා අඩු වටිනාකමකට තක්සේරු කිරීමට සිදුවීම හේතුවෙන් වන්දි ගෙවීම් වෙනුවෙන් ලද එම මුදල තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. ඒ අනුව වගකිව යුතු නිලධාරීන් විසින් එම ඉඩම්වල අයිතිය නිවැරදිව සනාථ කර ගැනීමට කටයුතු නොකිරීම මත වන්දි ගෙවීම් කටයුතු තවදුරටත් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය.	ඉඩම්වල අයිතිය නිවැරදිව තහවුරු කරගෙන වන්දි ගෙවීමට කටයුතු කල යුතුය.	වන්දි මුදල් ඉල්ලීම් කර ඇත්තේ සින්නකර ඉඩම් ලෙස සලකා වුවද වන්දි මුදල් ගෙවීමට පෙර එම ඉඩම් රජයේ ඉඩම් බවට තහවුරු වීම හේතුවෙන් වන්දි ගෙවීම තාවකාලිකව නතර කරන ලදි. එම වරද නිවැරදි කර ගැනීමේ දී පෙර තක්සේරු වටිනාකම සංවර්ධන වටිනාකමට අනුව තක්සේරු වටිනාකමක් ලබා දී ඇත. ඒ අනුව ඉඩම් හිමියන්ට ලැබෙන වන්දි මුදල අඩු වීම හේතුවෙන් ඔවුන් තම ඉඩම් අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති අතර එම තීරණ ලැබෙන තෙක් ලැබී ඇති තක්සේරු මුදල තැන්පත් ගිණුමේ රඳවා ඇති බව.
(iii) හදපානාගල ජලාශය වැඩිදියුණු කිරීම සඳහා අත්පත්කර ගන්නා ලද කැබලි අංක 1381 ඉඩමේ පිහිටි නිවාස ඉවත් කර නොගැනීම හේතුවෙන් රු.1,474,975 ක් 2024 පෙබරවාරි 08 දින සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.	වන්දි මුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය.	හදපානාගල ජලාශය සංවර්ධනයේදී අත්කර ගන්නා ලද කැබලි අංක 1381 හි පිහිටි නිවස කඩා ඉවත් කර ගැනීම සඳහා තක්සේරු කරන ලද මුදලින් මූලිකව 75% ක මුදලක් ගෙවා ඇති අතර නිවස හිමියා විසින් මෙම නිවස කඩා ඉවත් කිරීම ප්‍රමාද කරන බැවින්, මෙම ඉතිරි 25% මුදල තැන්පත් ගිණුමේ රඳවා ඇත. මේ වන විට නිවාස හිමියා වෙත

			සන්තකය ලබා ගැනීමේ පනත යටතේ අස්කිරීමේ දැන්වීම් යොමු කර ඇත. ඉදිරියේදී අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව.
(iv)	හදපානාගල ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේදී වගා කිරීමට නොහැකි වූ කන්න වෙනුවෙන් වන්දි ලබාදී ඉතිරි වූ රු.90,000 ක් නිරවුල් කිරීමකින් තොරව 2024 පෙබරවාරි 08 දින සිට තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	වන්දි ගෙවීමෙන් පසුව ඉතිරි වී ඇති මුදල නිරවුල් කල යුතුය.	හදපානාගල ජලාශය සංවර්ධනයේදී වගා කිරීමට නොහැකි වූ කන්න වෙනුවෙන් කන්න හානි ගෙවීම සඳහා ලබා දෙන පද මුදලින් හිමිකරුවෙකු ඉදිරිපත් නොවීම නිසා රු.90,000 ක මුදලක් ඉතිරි වී ඇත. එය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව.
(v)	වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම් අත්පත්කර ගැනීම 2012 වර්ෂයේ ආරම්භ කර, වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි 705 ක් හඳුනාගෙන තිබුණද, 2025 මාර්තු 21 දින වන විටත් ඉඩම් කට්ටි 95 ක් සඳහා වන්දි ගෙවීම් සිදුකර නොතිබුණි.	වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි සඳහා වන්දි ගෙවිය යුතුය.	තක්සේරු වාර්තා හා අනෙකුත් ගැටළු විසඳා ගැනීමෙන් අනතුරුව මෙම ඉඩම් කට්ටි 95 සඳහාත් වන්දි මුදල් ගෙවා අවසන් කිරීමට අපේක්ෂා කරන බව.
(vi)	හදපානාගල වම් ඉවුරු ඇල සකස් කිරීමේ දී ගල් බෝර දැමීම හේතුවෙන් හානි වූ නිවාසයක් වෙනුවෙන් ලබාදීමට තක්සේරු කරන ලද රු. 8,500 ක වන්දි මුදල සම්බන්ධයෙන් වන්දිලාභියා විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනය සම්බන්ධයෙන් 2021 වර්ෂයේ සිට විගණිත දිනය වන 2024 නොවැම්බර් 29 වන දින දක්වා වසර 04ක් ගතවී ඇතත් ප්‍රතිලාභියාට ගෙවීමට කටයුතු නොකර එම මුදල තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	වන්දි මුදල නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.	වන්දි ලාභියා රු.8500 ක වන්දි ප්‍රමාණවත් නොවන බව දන්වා ඉදිරිපත් කර ඇති අභියාවනාව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ සම්බන්ධවත් සිහිකැඳවීම් යොමු කලද පිළිතුරු ලැබී නොමැති අතර වන්දිලාභියා වන්දි මුදල ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති බව.

(ආ)	මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024 අප්‍රේල් 04 දිනැති හා අංක DFD/2024 – 01 දරණ චක්‍රලේඛයේ අංක 2.1 ඡේදය ප්‍රකාරව අඩු ආදායම්ලාභීන් වෙත සහල් බෙදාහැරීමේ වැඩසටහන 2024 සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වෙනත් කිසිදු කාර්යයන් සඳහා යොදා නොගත යුතු ලෙසත් වැඩසටහන අවසන් වූ වහාම ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත භරවා යැවිය යුතු ලෙසත් උපදෙස් නිකුත් කර තිබුණද, ඊට පටහැනිව වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය සංවර්ධන ව්‍යාපෘතියට අදාලව රු.21,585 ක් වියදමක් දරා තිබූ අතර, ඉතිරිව පවතින රු.396,675 ක් විගණිත දිනය වන 2024 නොවැම්බර් මස 29 දින වන විටත් භාණ්ඩාගාරය වෙත යවා නොතිබුණි.	චක්‍රලේඛයේ සඳහන් විධි විධානවලට පටහැනි කටයුතු කල නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉදිරියේ දී එවැනි වැරදි ගෙවීම් සිදු නොකිරීමට වගබලා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති බව.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් ග්‍රාම ශක්ති සමිති 33 ක රු. 27,232,480 ක් 2018 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.	අක්‍රියව පවතින සමිති ක්‍රියාකාරී තත්තවයට පත් කර රජයේ මුදල් ප්‍රයෝජනයට ගැනීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතුය.	බුත්තල - සෞභාග්‍යා සංවර්ධන කාර්යංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව සක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල එකඟතාවය මත හඳුනාගෙන ඇති ප්‍රජා සංවර්ධන අවශ්‍යතා 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. මඩුල්ල - තම අරමුදල් රජයට පවාගන්නා ලෙස ලිඛිතව දැන්වූ සමිති 03 කට අදාල මුදල වන රු.1,511,077 ක් රජයට පවරා ගැනීමට අනුමැති ලබා ගැනීමට සෞභාග්‍යා සංවර්ධන කාර්යංශ අධ්‍යක්ෂ ජනරාල් වෙත

			යොමු කර ඇත. ඉතිරි සමිති 04 සක්‍රිය පවත්වා ගෙන යන්නේද යන්න වසම් භාර ආර්ථික නිළධාරීන්ගෙන් විමසා ඇති බව. බඩල්කුඹුර - සමිති 03 ක ක්ෂුද්‍ර මූල්‍ය ඒකය වැඩසටහන් ක්‍රියාත්මක වන අතර ඉතිරි සමිති 09 සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. වැල්ලවාය - එක් සමිතියක මුදල් මේ වන විට අයකරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පොදු තැන්පත් ගිණුමට තැන්පත් කර ඇති අතර ඉතිරි සමිති දෙකෙන් අයකර ගත යුතු රු.3,011,381 ක මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.
(ඇ)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් 04 දෙනෙකු, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් 17 දෙනෙකු සහ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විශ්‍රාම වැටුප් ලබන එක් ප්‍රතිලාභියෙකු වෙත විශ්‍රාම වැටුප් වශයෙන් පිළිවෙලින් රු.886,380 ක්, රු.1,584,676 ක් සහ රු.171,700 ක් ලෙස එකතුව රු.2,642,756 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවීමට තිබුණි.	වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් අඛණ්ඩව කඩිනමින් අයකර ගත යුතුය.	වැඩිපුර ගෙවන ලද මුදල මාසිකව අයකරමින් පවතින බව.

(ඉ)	බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ සමාලෝචිත වර්ෂයේ අඩු ආදායම්ලාභීන් වෙත සහල් බෙදාහැරීමේ වැඩසටහන සඳහා යොදාගත් අස්වැසුම් ප්‍රතිලාභී ලේඛනයේ QR කේත අංක HH-8-2-24-030-00055 දරණ හා හැඳුනුම්පත් අංක 672091284v දරණ පුද්ගලයා පිළිබඳව ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් තොරතුරු අනුව විදේශගතව සිට මෙරටට පැමිණ ඇත්තේ 2024 ඔක්තෝබර් මස වුවද, අස්වැසුම් වෙබ් අඩවිය හරහා ලබාගත් තොරතුරු අනුව එම පුද්ගලයා වෙත 2023 ජූලි මස සිට 2024 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල රු.225,000 ගෙවා තිබුණි.	විදේශ ගතව සිටින පුද්ගලයන්ට අස්වැසුම් ප්‍රතිලාභ දීමනා නොගෙවිය යුතු අතර ගෙවන ලද රු.225,000 ක මුදල අයකර ගත යුතුය.	අස්වැසුම් දීමනාව රු.222,500 ක් ගෙවා ඇති බැවින් ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුභ සාධක ප්‍රතිලාභ මණ්ඩලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව.
(ඊ)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අස්වැසුම් ප්‍රතිලාභීන් 05 දෙනෙකු මිය යාමෙන් පසුව ප්‍රතිලාභ ගෙවීම් නතර කිරීම මාස 03 සිට මාස 16ක් දක්වා ප්‍රමාදවීම හේතුවෙන් රු.198,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	වැඩිපුර ගෙවා තිබූ අස්වැසුම් ප්‍රතිලාභ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය.	වසම්භාර නිළධාරීන් ගනු ලැබූ ව්‍යක්තිය ක්‍රියාමාර්ග හේතුවෙන් අදාළ තොරතුරු ලබා ගැනීමට හැකියාවක් නොලැබුණි. 2024 ඔක්තෝම්බර් මාසයෙන් පසුව වසම්භාර නිලධාරීන් මෙම වැඩසටහනට සහය පළ කිරීම මත මියගිය පුද්ගලයින් පිළිබඳ තොරතුරු නිසි පරිදි වාර්තාවේ. ඉදිරියේ දී මෙවැනි අතපසු වීම් නොවීමට කටයුතු කරන බව.
(උ)	කාන්තා කාර්යාංශයේ වක්‍රීය ණය වැඩසටහන යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 39 ක ගෙන්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 290 ක ගෙන් සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 107 ක ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.498,900 ක්, රු.401,623 ක් සහ	වගකිව යුතු නිළධාරීන් මගින් හිඟ ණය ශේෂයන් අය කර ගැනීම් කාර්යක්ෂම කල යුතු ය.	බඩල්කුඹුර - 2024/12/30 දිනට අයකර ගත යුතු ණය ශේෂය රු.498,900 ක් වන අතර ඉතිරි ණය මුදල අයකර ගැනීමට වනිතා සංවර්ධන නිලධාරීන් විසින් අවශ්‍ය කටයුතු කරමින් පවතිනා බව. මඩුල්ල - ණය මුදල් වාරික වශයෙන් අය වෙමින් පවතින බව.

	රු.1,521,695 ක් ලෙස එකතුව රු.2,422,218 ක් තවදුරටත් අයවීමට තිබුණි.		වැල්ලවාය- 2025 පෙබරවාරි 28 දින වන විට රු.825,335 ක මුදල් අයවීමට පවතින අතර ණය ගෙවීම් කඩිනම් කරන ලෙස දැනුවත් කිරීම් සිදු කරනු ලබන බව.
(ඌ)	වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් වැඩිහිටි පුද්ගලයන් සඳහා ලබාදෙන නිත්‍ය ජීවනාධාරය ගෙවීමට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත ප්‍රතිලාභීන් සඳහා 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ලැබී තිබූ මුළු ප්‍රතිපාදන රු. 38,977,500 කින් රු. 1,965,300 ක් අදාල ප්‍රතිලාභීන් විසින් ලබා නොගැනීම හේතුවෙන් ආපසු හරවා යවා තිබුණි. එසේ ප්‍රතිලාභ ලබානොගත් පුද්ගලයන් අතරින් පුද්ගලයන් 11 දෙනෙකු අඛණ්ඩව ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා මාස 07 ක කාලසීමාවක් සඳහා ප්‍රතිලාභී මුදල් එකතුව රු.223,000ක් ලබාගෙන නොතිබුණු අතර, එම පුද්ගලයන් ප්‍රතිලාභ ලබා නොගැනීමට හේතු පරීක්ෂා කර එම පුද්ගලයන්ට එම ප්‍රතිලාභ අවශ්‍ය නොවන්නේ නම් වෙනත් සුදුසුකම් සහිත ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි.	ජීවනාධාර ගෙවීම සඳහා ලැබෙන ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගත යුතු අතර ප්‍රතිලාභ ලබා නොගන්නා අය පිළිබඳව අඛණ්ඩව පසු විපරම් කර වෙනත් සුදුසු ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කල යුතුය.	මින් ඉදිරියට ගෙවීම් ලේඛන නිසි පරිදි නඩත්තු කරන බව හා යම් ප්‍රතිලාභියෙකු අඛණ්ඩව මාස 03 ක් ප්‍රතිලාභ ලබා ගෙන නොමැති නම්, එම ප්‍රතිලාභය අත්හිටුවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.
(එ)	මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොරොත්තු ලේඛණයේ සිටින ආබාධිත පුද්ගලයන් සඳහා 2024 මැයි, ජුනි හා ජුලි මාස වෙනුවෙන් එක් පුද්ගලයෙකුට රු.22,500ක් බැගින් 2024 සැප්තැම්බර් මස ප්‍රදේශීය ලේකම් කාර්යාලීය සරප කවුන්ටරය හරහා ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබූ අතර, විගණිත දිනය වූ 2024 නොවැම්බර් 08 දිනය වන විටත් ප්‍රතිලාභීන් 14 දෙනෙකු	ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ ගෙවන ක්‍රමවේදය පිළිබඳව ඔවුන් අඛණ්ඩව දැනුවත් කර ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කල යුතුය.	ප්‍රතිලාභීන් 249 ක් එසේ දැනුවත් කල ද පුද්ගලයන් කිහිපදෙනෙකු විසින් විවිධ අපහසුතා හා රෝගාබාධ සඳහා ප්‍රතිකාර ලබා ගන්නා බැවින් නොපැමිණෙන බවත් ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට අවශ්‍ය කටයුතු සලස් වන බව.

	එකතුව රු. 315,000ක ප්‍රතිලාභී දීමනාව ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එම දීමනා ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන් නිවැරදිව දැනුවත් කර නොතිබුණි.		
(ඒ)	මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය මඟින් වැඩිහිටි පුද්ගලයන් සඳහා ලබාදෙන ජීවනාධාරය මගහැරීම සඳහා 2024 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා ලැබී තිබූ ප්‍රතිපාදන මුදල වන රු.26,845,200කින් රු.1,037,700ක් ආපසු හරවා යවා තිබුණි.	ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රියාවලිය කාර්යෂක්ෂම කර ලැබෙන ප්‍රතිපාදන උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය.	වැඩිහිටි මහ ලේකම් කාර්යාලය මඟින් මඩුල්ල කොට්ඨාශයේ වැඩිහිටි පුද්ගලයින් 1126 ක් සඳහා රු.3000 බැගින් ජීවනාධාර ගෙවීමට අනුමත වී ඇත. නමුත් මෙම පුද්ගලයින්ගෙන් සෑම මසකම ප්‍රතිලාභ ලබා නොගන්නා පුද්ගලයින් කිහිපදෙනෙක් හමුවන බව.
(ඔ)	මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය අභ්‍යන්තර විගණන ඒකක මඟින් අංක 2023/69 හා 2024 ජනවාරි 24 දින නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන වාර්තාවේ අංක 04 හා 05 යටතේ දක්වා තිබූ වකුගඩු හා වැඩිහිටි දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ, රෝගාධාර නව කාඩ්පත් නිකුත් කිරීමේ ලේඛණය විධිමත් ව පවත්වාගෙන යාම, මධ්‍යම රජයට අදාලව වකුගඩු ආධාර ගෙවීමේ ලේඛණයක් පවත්වා ගැනීම හා වැඩිහිටි දීමනා ගෙවීමේ නාම ලේඛණය විධිමත්ව පවත්වාගෙන යාම යන නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.	අභ්‍යන්තර විගණන වාර්තාව මඟින් ඉදිරිපත් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය.	දැනට රෝගාධාර නව කාඩ්පත් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. මධ්‍යම රජයට අයත් වකුගඩු ආධාර ගෙවනු ලබන්නේ Slip ක්‍රමය හරහා වන අතර අදාල ආධාර මාසිකව යොමු කරන බැවින් නාම ලේඛන පවත්වා ගෙන යනු නොලබන අතර වැඩිහිටි නාම ලේඛනයක් පවත්වා ගෙන යන බව.
(ඕ)	කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය කිරීම යටතේ නෙල්නා ඇග්‍රි ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත අඹ වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම් සඳහා බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රහතන්ගම ග්‍රාම නිලධාරී වසමේ අක්කර 500ක	රජයට අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර රාජ්‍ය ආදායමට බැර කල යුතුය.	ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ලබා දී සහන කාලය අනුව 2024 සඳහා අදාල මුදල ගෙවා ඇත. තව දුරටත් අය කර ගැනීමට ඇති මුදල රු. 19,600,000ක් බව.

	භූමි ප්‍රමාණයක් 2013 ජනවාරි 01 දින අංක 4/10/37266 දරණ දීර්ඝකාලීන බදු බලපත්‍රය ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු.24,500,000ක් තවදුරටත් අයවීමට පැවතුණි.		
(ක)	බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කර තිබූ අංක 4/10/19826 දරණ දීර්ඝකාලීන බදු බලපත්‍රයට අදාලව 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.700,769ක් තවදුරටත් අයවීමට තිබුණි.	රජයට අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර රාජ්‍ය ආදායමට බැර කල යුතුය.	2025.06.14 වන දිනයට අවුරුදු 30 ක බදු කාලය අවසන් වීම හා බදුකරු මිය යාම හේතුවෙන් හිඟ බදු අයකර ගැනීමට හැකියාවක් නොමැති හෙයින් හිඟ බදු මුදල් කපා හැරීමට අනුමැතිය ඉල්ලා පලාත් ඉඩම් කොමසාරිස් වෙත නිර්දේශ යොමු කර ඇති බව.
(ග)	බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙට්ටගම්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ හෙක්ටයාර් 0.102ක් දීර්ඝකාලීන බදු පදනම මත 2015 ජුනි 18 දින සිට වසර 30ක් සඳහා එක්සත් ගැමුණු මරණාධාර සමිතිය වෙත අංක 4/1037611 බදුකරය ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දින වන විට රු.480,000ක් අයකිරීමට පැවතුණි.	රජයට අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර රාජ්‍ය ආදායමට බැර කල යුතුය.	බදුකරුගේ ඉල්ලීම අනුව බදු කොන්දේසි ලිහිල් කිරීමට අවශ්‍ය නිර්දේශ පලාත් ඉඩම් කොමසාරිස් වෙත ලබා දී ඇත. ඒ සම්බන්ධ පිළිතුරු තවමත් ලැබී නොමැති අතර ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව.
(ඝ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත 2019 ඔක්තෝබර් 11 දින බලපත්‍ර අංක 4/10/5700 යටතේ රජයේ ඉඩමක් බදුකරුවෙකු වෙත බදු දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයවිය යුතු හිඟ බදු මුදල රු.1,960,000 ක් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 29 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	රජයට අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර රාජ්‍ය ආදායමට බැර කල යුතුය.	බදුකරු හදිසි අනතුරකට පත්වීම හේතුවෙන් මේ වන විට දැඩිව රෝගාබාධව සිටින අතර ඔහුගේ බිරිඳ විසින් බදු ගෙවීමට නොහැකි බවට අභියාචනා ඉදිරිපත් කර ඇත. ඒ සඳහා උපදෙස් ඉල්ලා පලාත් ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇති බව.

(ට)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනවසර ඉඩම් නියමානුකූල කිරීම යටතේ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට 2023 හා 2024 වර්ෂයේ නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව 930ක් වූ අතර, බෙදාදී ඇති බලපත්‍ර සංඛ්‍යාව 778ක් වූයෙන් බලපත්‍ර 152ක් තවදුරටත් නිකුත් කිරීමට පැවතුනි.	ලබා නොදුන් බලපත්‍ර ප්‍රතිලාභීන් වෙත ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිකුත් කිරීමට ඇති බලපත්‍ර සංඛ්‍යාව 139 ක් වන අතර අදාල බලපත්‍රලාභීන් දැනුවත් කර ඇතත් මෙතෙක් බලපත්‍ර ලබා ගැනීමට පැමිණ නොමැති බව.
(ඩ)	බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, අදාලව රාජ්‍ය ආයතනවල නිර්දේශයන් ලබාදීමේ ප්‍රමාදයන් නිසා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභීන් 26 දෙනෙකු වෙත බලපත්‍ර ලබාදීමට වර්ෂ 01 සිට 45ක් දක්වා කාලයක් ගතවී තිබුණි.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කල යුතුය.	ප්‍රතිලාභීන් තිදෙනෙකුගෙන් බදු කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි ප්‍රතිලාභීන් 23 දෙනාට අදාල බදුකරවල ඉඩම් පවරා ගැනීමේ ගැටලු, පලාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය නොලැබීම ආදී හේතුවෙන් ප්‍රමාදව ඇති බවත් ඉදිරියේ දී වක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන බව.
(ණ)	රාජ්‍ය ආයතනවල නිර්දේශයන් ලබාගැනීමේ ප්‍රමාදයන් නිසා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම් කල ප්‍රතිලාභීන් 19 දෙනෙකු වෙත බලපත්‍ර ලබාදීමට වර්ෂ 03 සිට 17 ක් දක්වා කාලයක් ගතවී තිබුණි.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කල යුතුය.	බදු බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලියේදී සම්බන්ධවන අනෙකුත් ආයතනවලින් වාර්තා හා නිර්දේශයන් ලබා දීමේ ප්‍රමාදයන් මත කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී ආයතන සමඟ සම්බන්ධ වී ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරන බව.
(ත)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අනවසර ඉඩම් නියමානුකූල කිරීම යටතේ ප්‍රතිලාභීන් 3,591 දෙනෙකු ලියාපදිංචි වී තිබූ අතර, බලපත්‍ර 409 ක් නිකුත්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දින වන විට ප්‍රතිලාභීන් 253 දෙනෙකුට බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.	බලපත්‍ර ලබා නොදුන් ප්‍රතිලාභීන් සඳහා බලපත්‍ර ලබාදීම කඩිනම් කල යුතුය.	ඇතැම් බලපත්‍රලාභීන් ඉල්ලුම් කර නැවත නොපැමිණීම, පසුගිය මැතිවරණය හේතුවෙන් මෙම කටයුතු තාවකාලිකව අත්හිටුවීම නිසා ප්‍රමාදයන් සිදු වී ඇති බව.

(ද)	2024 මැයි 17 වන දින සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි අදාල ග්‍රාම නිලධාරිවරයාගේ නිර්දේශය සහිතව බුත්තල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ගෝනගං ආර ග්‍රාම නිලධාරී වසමේ ර.බී 22B වර්ගයේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා එම ස්ථානය සුදුසු බව හා මහජන විරෝධතාවයන් නොපවතින බව නිර්දේශ කර තිබුණි. ඒ අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝගය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2024 ජූලි 30 දින ර.බී.22B වර්ගයේ සුරාබදු බලපත්‍රයක් නිකුත් කර තබුණි. 2024 අගොස්තු 16 දින සිට වරින් වර මෙම සුරාබදු බලපත්‍රලාභී ස්ථානයට විරුද්ධතාවය පල කරමින් විවිධ පාර්ශවයන්ගේන් ලිපි ලැබී තිබිය දී ප්‍රාදේශීය ලේකම් විසින් විරෝධතා නොමැති බවට නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය විය.	මහජන විරෝධතා සැලකිල්ලට ගෙන එය නිවැරදි කිරීමෙන් පසුව නිර්දේශ ලබාදීමට කටයුතු කල යුතුය.	අදාල ආයතනය සම්බන්ධයෙන් පවතින විරෝධතා පිළිබඳව 2024.12.11 වන දින සුරාබදු දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් පැවැත් වූ අතර එහි වාර්තාව තවමත් ලැබී නොමැත. ආරම්භක අවස්ථාවේ දී අදාළ ග්‍රාම නිළධාරියා විසින් නිර්දේශ ලබා දීම සඳහා වසමේ ක්‍රියාකාරී සමිතිවලින් එකඟතාවය ලබා ගත් බව.

2.4 තැන්පත් ශේෂයන්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බඩල්කුඹුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අලුපොත භූගත ජල තටාකය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම වෙනුවෙන් මො/ප්‍ර 7804 දරණ දීමනා පත්‍රය සහිත ඉඩමෙන් කොටසක්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරාගැනීමට 2020 දෙසැම්බර් 11 දින රු.200,000ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 18 වන විට එම මුදල	ඉඩම පවරාදීම කඩිනම් කර තැන්පත් මුදල් නිරවුල් කල යුතු ය.	රු.16,200 ක මුදලක් මැනුම් ගාස්තු වශයෙන් වියදම් වී ඇත. රු. 183,800 මුදලක් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන ඇති අතර ඉතිරි මුදල ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයට යොමු කිරීමට කටයුතු කරන බව.

	තැන්පත් කර වසර 04 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, ඉඩම පවරා දීම අවසන් කර නොතිබුණි.		
(ආ)	මුදල් රෙගුලාසි 177(1) අනුව රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකි ඉක්මණින් ප්‍රේෂණය කළ යුතු වුව ද, සියඹලාණ්ඩුව සහ කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දැව ප්‍රවාහන බලපත්‍ර ගාස්තු, වාහන දඩ, මත්පැන් බලපත්‍ර සඳහා මුද්දර ගාස්තු සහ මුද්දර ගාස්තු ආදායම් රු.678,916 ක් ප්‍රේෂණය නොකර ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් තැන්පත් ගිණුම් අංක 6000-0-0-18-38 හි රඳවා ගෙන තිබුණි.	රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් ලැබෙන සියලුම ආදායම් අප්‍රමාද ව ප්‍රේෂණය කළ යුතු ය.	එකතු කරන ලද ආදායම් කඩිනමින් අදාළ පාර්ශවයන් වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.
(ඇ)	මුදල් රෙගුලාසි 177 (1) අනුව එකතු කර ගනු ලබන රජයේ මුදල් දිනපතා හෝ හැකි ඉක්මනින් ප්‍රේෂණය කලයුතු වුවත්, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2024 ජූලි මස සිට 2024 ඔක්තෝබර් මස දක්වා අයකර තිබූ වාහන දඩ, දැව බලපත්‍ර ගාස්තු හා මුද්දර ගාස්තු යනාදී ආදායම් වලට අදාල රු. 59,810 ක් අදාල ආයතන වෙත ප්‍රේෂණය කිරීමේදී මාස 01 සිට මාස 03 දක්වා ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.	රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් ලැබෙන සියලුම ආදායම් අප්‍රමාද ව ප්‍රේෂණය කළ යුතු ය.	අදාල ආදායම් මේ වන විට අදාල ආයතන වෙත ප්‍රේෂණය කර ඇති අතර, ඉදිරියේ දී නියමිත දිනට ප්‍රේෂණය කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති බව.
(ඈ)	මුදල් රෙගුලාසි 571(3) අනුව කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කළයුතු වුව ද, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර දෙකක් ඉක්ම වූ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් එකතුව රු.120,628 ක් නියාදනය කර නොතිබුණි.	කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කළ යුතු ය.	2024 වර්ෂයේ 12.31 දිනට අදාළව සකස් කළ පොදු තැන්පත් ගිණුම් කාල විෂ්ලේශණ වාර්තාව සඳහා තොරතුරු කැඳවීමේදී එම කාර්යාලය මගින් ලබා දී තිබූ තොරතරු අනුව මෙම අගයන් වසර 02කට අඩු ශේෂ යටතේ දක්වා ඇති අතර, ඉදිරියේදි මෙම වාර්තා සඳහා තොරතුරු

			ලබා දීමේදී නිවැරදිව දින අනුව අවශ්‍ය තොරතුරු නිසි පරීක්ෂාවකින් අනතුරුව ලබා දෙන මෙන් සියළුම කාර්යාලයන්හී නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දුන් බව.
(ඉ)	විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය (SESRIP – Package 04) යටතේ යෝජිත වැල්ලවාය වොට් 33 අධිසැර විදුලිය බෙදාහැරීමේ මධ්‍යස්ථානය (ග්‍රෑන්ට් උපපොල) ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ලැබී තිබුණු රු. 700,000 ක් 2019 අගෝස්තු 29 වන දින සිට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල තැන්පත් ගිණුමේ රඳවා තිබුණු අතර, අදාල කාර්යය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ය.	අදාළ ඉඩම අත්කර ගැනීමේ කටයුතු 09 වගන්තිය දක්වා සිදු කර ඇති අතර , ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් අත්කර ගැනීම අනවශ්‍ය බව දන්වා ඇත. මෙම අත්කර ගැනීමට අදාළව ඉඩම් අමාත්‍යාංශය විසින් යම් මුදලක් වියදම් කර ඇත්නම් එය අයකර ගෙන ඉතිරි මුදල විදුලිබල මණ්ඩලය වෙත යැවීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කරන බව.
(ඊ)	වැල්ලවාය II අදියර ජල ව්‍යාපෘතිය යටතේ කොළඹොරේ ජල පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අදාල මූලික වියදම් ලෙස 2021 ඔක්තෝබර් 05 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.180,617 ක් අදාල කාර්යය ඉටුනොකිරීම මත වසර 04 කට අධික කාලයක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ය.	06 වන වගන්තිය යටතේ මූලික පිඹුර සකස් කිරීම සඳහා මැනුම් ගාස්තු වශයෙන් රු.53,808ක මුදලක් ගෙවීම සඳහා සර්වේයර් ජනරාල් නමින් චෙක්පතක් 2024.12.25 දින යොමු කර ඇති අතර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2021 වර්ෂයේ ගංවතුර, නායයෑම් හා නායයෑම් අධි අවදානම් සහිත තැනැත්තන් නැවත පදිංචි කිරීම යටතේ ඉඩම් මිලදී ගෙන නිවාස ඉදිකර ගැනීම සඳහා ප්‍රතිලාභියෙකුට රු. 1,300,000 ක් ගෙවා තිබුණි. විගණන දිනය වූ 2024 නොවැම්බර් 08 දින වන විටත් ප්‍රතිලාභියා විසින් නිවස ඉදිකර නොතිබුණි.	නිවාසය ඉදි කිරීම කඩිනම් කිරීම හෝ නිවාසය ඉදි කිරීම් කටයුතු නොකරන්නේ නම් ගෙවන ලද මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතු ය.	ආර්.එම්.නිශාන්ත රත්නායක මහතා හට ගෙවන ලද රු.1,300,000 ක මුදල නීතිමය මාර්ගයෙන් නැවත අයකර ගැනීම සඳහා මේ වන විට උපදෙස් ඉල්ලමින් නීතිපති වෙත ලිපියක් යොමු කර ඇති බව.

3.2 කර්මාන්ත සඳහා වැඩිපුර ගෙවීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් නෙලියද්ද හදබිම ගම්මාන ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ යකඩ දැල් ගැසීම සඳහා රු.32,543 ක් සහ පොළොව කොන්ක්‍රීට් කර සුද මැදිම සඳහා රු. 3,052 ක් වැඩිපුර ගෙවා තිබුණි.	වැඩිපුර ගෙවීම අප්‍රමාදව අය කල යුතු ය.	අදාල කොන්ත්‍රාත් සංවිධානය වෙත වැඩිපුර ගෙවා ඇති මුදල් අතරැඳවුම් නිදහස් කිරීමේදී අය කර ගෙන වවුචර්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ආපදා කළමනාකරණ ඒකකයේ කාර්යසාධනය විශේෂිත දර්ශක 07 ක් යටතේ සියයට සියයක් ලෙස සඳහන්ව තිබුණද, ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් ලෙස 2024 මැයි 20 දින ආරම්භ කර තිබුණු පුවක්පිටිය වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය දෙසැම්බර් 31 දිනට අවසන් වී නොතිබුණි. 2025 පෙබරවාරි මාසයේ ප්‍රගති වාර්තාව අනුව එදිනට එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 0.25 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 25 ක් පමණ වී තිබුණි.	කාර්යසාධන වාර්තාව නිවැරදි සහ සත්‍ය තොරතුරු ඇතුලත් කර සකස් කල යුතු ය.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.
(ආ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 04.27 යටතේ විද්‍යුතා සංවර්ධන කටයුතු ඇගයීම් සිදුකිරීමට පිහිටුවා තිබූ විශේෂිත දර්ශක 10 හි කාර්යසාධන මට්ටම සියයට සියයක් ලෙස දක්වා තිබුණි. විද්‍යුතා සංවර්ධන අංශය විසින් ඉදිරිපත් කල වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව ව්‍යවසායකත්වය සංවර්ධන හා තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන්, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික සත්කාර සේවා වැඩසටහන් සහ ග්‍රාමීය නිෂ්පාදන සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා හා ප්‍රමිති සහතික ලබාදීම යන වගකීම් ක්ෂේත්‍රයන්හි	කාර්යසාධන වාර්තාව නිවැරදි සහ සත්‍ය තොරතුරු ඇතුලත් කර සකස් කල යුතු ය.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.

	වාර්ෂික ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිවෙළින් 67% , 43% , 86% ක් සහ 38% ක් වී තිබුණි.		
(ඇ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 4.12 යටතේ ආපදා සහන සේවා කටයුතුවල කාර්යසාධනය ඇගයීම් යටතේ අනාරක්ෂිත බව අවම කිරීම යන දර්ශකයේ කාර්යසාධනය සියයට සියයක් ලෙස දක්වා තිබුණද, ආපදා සහන සේවා අංශයේ වාර්ෂික ප්‍රගති වාර්තා අනුව අනාරක්ෂිත බව අවම කිරීමට ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.	කාර්යසාධන වාර්තාව නිවැරදි සහ සත්‍ය තොරතුරු ඇතුලත් කර සකස් කල යුතු ය.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.
(ඈ)	වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ආපදා සහන සේවා අංශයේ නැවත පදිංචි කිරීම සඳහා වන දර්ශකයේ කාර්යසාධනය සියයට සියයක් ලෙස දක්වා තිබුණද, එම අංශයෙන් ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාව අනුව වර්ෂය තුළ ලැබූ ප්‍රතිපාදන බෙදා හැරීමේ මූල්‍ය ප්‍රගතිය පමණක් දැක්වුණු අතර භෞතික ප්‍රගතිය ඇගයීමට ලක්කර නොතිබුණි. තවද, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචි කිරීම් සඳහා ප්‍රතිපාදන ලබාදුන් ප්‍රතිලාභීන් දෙදෙනෙකුගේ නිවාස ඉදිකිරීම් අවසන් වී නොමැතිව අතරමඟ නැවතී ඇති බව නිරීක්ෂණය වූයෙන් නැවත පදිංචි කිරීම දර්ශකයේ කාර්යසාධනය සියයට සියයක් බව දැක්වීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.	කාර්යසාධන වාර්තාව නිවැරදි සහ සත්‍ය තොරතුරු ඇතුලත් කර සකස් කල යුතු ය.	ඉදිරියේදී කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී නිවැරදි දත්ත පදනම් කරගෙන දර්ශක සකස් කරන ලෙස අදාල ඒකකයන් දැනුවත් කල බව.

3.4 ප්‍රසම්පාදනයන්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණද, විගණිත දිනය වන 2024 නොවැම්බර් 29 දින වන විටත් විදුලි ජනක යන්ත්‍රයන් මිලදී ගෙන නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු ය.	මහජන සේවය අඛණ්ඩව සැපයමේ අරමුණින් විදුලි බිඳ වැටීම නිසා සිදුවන අපහසුතා මඟ හැරවීම සඳහා විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කල බැවින් ප්‍රසම්පාදන සැලැස්මට විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම ඇතුලත් කල බව.
(ආ)	අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීමත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහල් වෙළඳපල මිල ගණන් සමීක්ෂණය කර සහල් මිලදී ගැනීමට කටයුතු නොකිරීමත්, මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක පරිදි කටයුතු නොකිරීමත්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 04 දිනැති අංක DFD/2024-01 දරන චක්‍රලේඛයේ 3.6 ඡේදයේ දක්වා ඇති පරිදි රජයේ වියදම් අවම වන ආකාරයට කටයුතු නොකිරීමත්, 2024 අප්‍රේල් 10 හා 2024 ජුනි 10 දිනැති ප්‍රතිපාදන අනුමත කිරීමේ ලිපිවල අංක 04 ඡේදයේ සඳහන් පරිදි වියදම් දැරීමේදී රජයේ නිතීරීති වලට අනුව	සහල් මිලදී ගැනීමේදී රජයට වාසිදායක ලෙස කටයුතු නොකිරීමෙන් රජයට සිදු ව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු ය.	මුදල්, ආර්ථික හා ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් සහල් මිල දී ගැනීමේ සහතික මිල තීරණය කර ඇති බව.

	කටයුතු නොකිරීමත් නිසා මොනරාගල දිස්ත්‍රික්කය තුල සහල් මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් රජයට රු. 36,649,480 ක පාඩුවක් සිදුව ඇති බවට නිරීක්ෂණය විය.		
(ඇ)	මැදගම සහ සියඹලාණ්ඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක පරිදි කටයුතු නොකර සහ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 04 දිනැති අංක DFD/2024-01 දරන චක්‍රලේඛයේ 3.6 ඡේදය අනුව රජයේ වියදම් අවම වන පරිදි අඩු මිලක් සහිත රතු කැකුළු සහල් මිලදී ගැනීමට කටයුතු නොකර වැඩි මිලක් සහිත සුදු කැකුළු සහල් මිලදී ගැනීම නිසා මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 386,010 ක්ද, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 571,860 ක්ද ලෙස එකතුව රු.957,870 ක පාඩුවක් රජයට සිදු කර තිබුණි.	සහල් මිලදී ගැනීමේදී රජයට වාසිදායක ලෙස කටයුතු නොකිරීමෙන් රජයට සිදු ව ඇති පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු ය.	අඩු ආදායම්ලාභී පවුල් සඳහා අවශ්‍ය සම්පූර්ණ සහල් එකම වර්ගයකින් ලබාදීමට තරම් ප්‍රමාණවත් වී තොග නොමැති බැවින් වර්ග දෙකෙන්ම සහල් ලබා දීමට සිදු වූ අතර දෙවන අදියරේදී සුදු සහල් ලබා ගැනීමට සිදුවූයේ සැපයුම්කරුවන් සතුව රතු සහල් නොමැති වීම නිසා බව.

3.5 වත්කම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී පිත්තල ජල කරාම 60 ක් ගබඩාව තුලදී හඳුනාගෙන ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර තිබුණ ද ඒවා ලැබුණේ කාගෙන් ද හෝ කුමන කටයුත්තක් සඳහා මිල දී ගත් ඒවා ද හා ඒවායේ වටිනාකමද හඳුනාගෙන නොතිබුණි.	ගබඩාවේ පවතින භාණ්ඩ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලේඛනගත කර පවත්වාගෙන යා යුතු අතර ජල කරාම ඵලදායී කාර්යයකට යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් මිලදී ගත් තොරතුරක් ලබාගත නොහැකි වූ අතර දීර්ඝ කාලයක් තිස්සේ ගබඩාව තුළ පැවතී ඇත. 2023 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණයට යොමුවූ බැවින් ඒ අනුව අදාළ භාණ්ඩ තොග පොතට ඇතුළත් කර ඇත.
(ආ)	ලෝක ආහාර වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අංක WP JV 5850 දරන ජීප් රථය මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණ ද, විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විටත් එම ජීප් රථය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගනු ලබන වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතු ය.	ලෝක ආහාර වැඩසටහන විසින් පරිත්‍යාග කරනු ලැබූ වාහන එම අදාල ආයතන වෙතම පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර ඒ සමඟ MTA 6 හා MTA8 ආකෘති පත්‍රද යොමු කොට ඇති බව.
(ඇ)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ලැප්ටොප් 04 ක් හා Tablet 02 ක් වසරකට වැඩි කාලයක සිට භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබූ අතර, විගණිත දිනය වූ 2025 මාර්තු 17 දින වන විටත් ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය.	අදාල ආයතන විසින් අලුත්වැඩියා කිරීමට නොහැකි බව දන්වා ඇති අතර 2024 වර්ෂය භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් කර අපහරණය කිරීමට කටයුතු කරන බව.

(ඇ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2017 ජූලි 14 දින ලබා දී තිබුණු අංක WPRY 0572 දරණ ට්‍රැක්ටර් බවුසරය 2023 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණු අතර විගණන දිනය වූ 2024 ඔක්තෝබර් 25 දින ට්‍රැක්ටර් බවුසරය ලබා දී වසර 07 ක් ගතවී තිබුණත්, ධාවන සටහන් අනුව කිලෝමීටර් 822.6 ක් පමණ අඩු දුරක් ධාවනය කර තිබුණි.	ට්‍රැක්ටර් බවුසරය ධාවනය කිරීම හෝ එය ලබා දුන් ආයතනයට නැවත යොමු කිරීමට කටයුතු කල යුතුය.	මෙම බවුසරය අදාළ කාල සීමාව තුළදී නියහය පැවති අවස්ථාවලදී ආපදා කළමණාකරණය සිදු කිරීම යටතේ බහුකාර්යය සංවර්ධන සහයක රියදුරු මහතෙකු මාර්ගයෙන් ධාවනය කිරීම සිදුකර ඇතත් ඔහු දෛනික ධාවන සටහන් නඩත්තු කර නොමැත. එබැවින් ඔහු සතුව තිබූ තොරතුරු අනුව දෛනික ධාවන සටහන් සකස් කර ඇත. එම තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.
(ඉ)	ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අයත් අංක WPL 02901 දරණ ලොරි බවුසර් රථය 2019 අගෝස්තු 09 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු අතර 2021 දෙසැම්බර් 22 දිනෙන් පසුව එම රථය භාවිතා කර නොතිබුණි. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම බවුසර් රථය සඳහා බැටරි 02ක් මිලදී ගැනීමට 2023 නොවැම්බර් 27 වන දින රු.113,000ක් වියදමක් දරා තිබුණි. විගණිත දිනය වූ 2024 නොවැම්බර් 08 දින වන විටත් අදාල රථය ධාවනය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි.	රජයේ මුදල් ඵලදායීව භාවිතා කල යුතු අතර ලොරි බවුසර් රථය ධාවනය කිරීම හෝ එය ලබා දුන් ආයතනයට නැවත යොමු කිරීමට කටයුතු කල යුතු ය.	හදිසි අවශ්‍යතාවයකදී ජලය බෙදාදීමේ කටයුතු සඳහා බවුසරය ක්‍රියාකාරී තත්වයේ තබා ගත යුතු බැවින් 2023 ජුනි මස මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර, ඒ අනුව ලද මුදල් වලින් මෙම බැටරි දෙක මිලට ගෙන වාහනයට යොදන ලදි. මෙම බැටරි දෙක යොදා වාහනය සතියකට වරක් පනගන්වා තබා ක්‍රියා විරහිත කරන අතර එමගින් බැටරිය භාවිතාකල හැකි තත්වයේ පවත්වා ගෙන යන බව.

(ඊ)	බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් RR0213 දරණ ට්‍රැක්ටර් බවුසරය 2022 අප්‍රේල් 12 වන දිනයෙන් පසුව ධාවන සටහන් ලියා නොතිබුණු අතර, එදිනට බවුසරය ධාවනය කර තිබූ මුළු කිලෝමීටර ගණන 822.6 ක් ලෙස දක්වා තිබුණද, 2024 මැයි 02 දිනට වාර සේවා ඉල්ලුම් පත්‍රයේ ධාවන මීටරයේ දැක්වෙන කිලෝමීටර ගණන 933 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව ට්‍රැක්ටර් බවුසරය සත්‍ය වශයෙන් ධාවනය කල දුර හා ධාවන සටහන්වල දක්වා තිබූ දුර අතර කිලෝමීටර 162 ක වෙනසක් නිරීක්ෂණය විය.	ධාවන සටහන් නිවැරදි සහ සත්‍ය තොරතුරු ඇතුලත් කර පිළියෙල කල යුතු අතර ධාවනය කල දුර සහ ධාවන සටහන්වල ඇතුලත් දුර අතර වෙනසක් නොතිබිය යුතු ය.	විගණන නිරීක්ෂණය පිළිගනිමි. ධාවන සටහන යාවත්කාලීන කර ඔබ වෙත පිටපත් යොමු කිරීමට කටයුතු කරන බව.
(උ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය පිහිටි ඉඩමේ අයිති පවරා ගැනීමට විගණන දිනය වූ 2024 නොවැම්බර් 29 දින වන විටත් කටයුතුකර නොතිබුණි.	ඉඩමේ අයිති පවරා ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය.	ප්‍රාදේශීය ලේකම් නව නිවස සහිත ඉඩම මැනුම් කිරීම සඳහා 2024 අගෝස්තු 31 දිනැතිව මැනුම් ඉල්ලීම් අංක 2024/16 යොමු කර ඇති බව.

3.6 පාඩු හා හානි

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය ව්‍යාපෘතියට අදාලව 2015 වර්ෂයේ දී ප්‍රතිලාභියෙකු වෙත රු.850,000 ක් වැඩිපුර ගෙවීම මත සිදුව තිබූ පාඩුව, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදා දීමේ වැඩසටහන අතරතුර දී සිදු වී තිබූ රු.68,008 ක අලාභය සහ 2023 වර්ෂයේ දී මොනරාගල අංක 2	සියලුම පාඩු හා හානි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු ය.	වැල්ලවාය - මෙම සිදුවීම 2015 වර්ෂයේ සිදු වූ සිදුවීමක් වන අතර, මේ සඳහා වන ගෙවීම වෙනත් ආයතනයට සම්බන්ධ වන බැවින් අප විසින් 2015 සිට මේ දක්වා මෙම සිදුවීම හානි හා පාඩු මඟින් මූල්‍ය ප්‍රකාශනයන් වෙත ඇතුලත් කර නොමැත. ඉදිරියේදී මේ සම්බන්ධව පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු

	දරන සංචාරක බංගලාව සොරුන් කැඩීම හේතුවෙන් සිදු වී තිබූ රු. 54,519 ක පාඩුව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර නොතිබුණි.		සිදු කරන බව. සෙවනගල - ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමේදි මෙම අලාභය ඇතුලත් කිරීමට කටයුතු කරන බව. සංචාරක බංගලාව - මෙම හානිය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් විමසීම් කොට මූල්‍ය ප්‍රකාශනයන් වල ඇතුලත් කිරීමට කටයුතු කරන බව.
(ආ)	සමාලෝචිත වර්ෂය වන විට හානි හා පාඩු සිද්ධීන් 03 ක් සම්බන්ධයෙන් නිකුත් කර තිබූ ප්‍රාරම්භක වාර්තා අනුව රු.9,969,238 ක අලාභයක් මූල්‍ය ප්‍රකාශන තුල පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයේ දක්වා තිබුණ ද තවත් එවැනි සිද්ධීන් 02 ක් සම්බන්ධයන් ප්‍රාරම්භක වාර්තා අනුව හඳුනාගෙන තිබූ රු.208,524 ක අලාභය මූල්‍ය ප්‍රකාශන තුල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.	ප්‍රාරම්භක වාර්තා මඟින් තහවුරු කරගෙන තිබූ හානි හා පාඩුවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු ය.	මෙම වාහන අනතුරු 02කට අදාළ අලාභයන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීම අතපසුවීමකින් මගහැරී ඇති අතර. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීමේදි ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.

3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් 03 ක් සඳහා 2025 අප්‍රේල් 25 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	රජයේ නිවාස වෙන්කර දීම්, නඩත්තුව හා කුලී අය කිරීම් සහ වාහන භාවිතය හා නඩත්තුව පිලිබඳ පරීක්ෂාව	සියලු විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු සැපයිය යුතු ය.	විගණන විමසුම් සඳහාද කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව.
(ආ)	මූල්‍ය විගණනය - 2024		
(ඇ)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2023 භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් ක්‍රියානොකිරීම.		

3.8 කළමනාකරණ දුර්වලතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාල තක්සේරු වාර්තාව අනුව රජයේ නිවාස සඳහා තක්සේරු කුලී අය නොකිරීම මත 2024 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.291,900 ක මුදලක් අදාල නිලධාරීන් විශ්‍රාම යාම හා ස්ථානමාරු ලැබීම යන කරුණු මත ක්‍රමවත්ව අය නොවන බව නිරීක්ෂණය විය.	හිඟ කුලී මුදල් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු ය.	2025.03.18 දිනට රු.26,663 ක මුදලක් රජයට අය වී ඇති බව.
(ආ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා හා පිරිමි සාද නිවාස සහ නිල සෙවන නිවාස 2කින් 2024 වර්ෂය සඳහා අයවිය යුතු රු.297,143 ක කුලී මුදලක් අදාල නිලධාරීන්ගෙන් අය කරගෙන නොතිබුණි.	හිඟ කුලී මුදල් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු ය.	රු.141,437.40ක මුදලක් අය වී ඇති බව.

(ඇ)	පෞද්ගලික ආයතනයක් වෙත කුලියට ලබා දී තිබූ අංක 28/49 දරණ රජයේ නිවාසය මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2022 නොවැම්බර් 24 දින පවරාගෙන තිබුණද, අදාල ආයතනයෙන් 2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට ලැබිය යුතු රු.33,000 ක හිඟ කුලිය විගණන දිනය වූ 2025 ජනවාරි 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	හිඟ කුලි කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු ය.	පිළිතුරු නොමැත.	ලබා	දී
(ඈ)	ජාතික ඒකාබද්ධ සංවර්ධන නිලධාරියෙකු වෙත ලබා දී තිබූ අංක 28/59 දරණ රජයේ නිවාසය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2022 මැයි 17 වන දින පවරාගෙන තිබුණද, ඔහුගෙන් 2022 මාර්තු සිට මැයි දක්වා කාලයට අදාලව අයකරගත යුතු රු.10,500 ක නිවාස කුලිය අයකරගෙන නොතිබුණි. තවද, මෙම රජයේ නිවාසය 2022 නොවැම්බර් 25 දින වෙනත් නිලධාරියෙකු වෙත ලබා දී තිබුණද, ඔහු එහි පදිංචි නොවීම හේතුවෙන් 2023 පෙබරවාරි මස ආපසු අදාල නිවාසය පවරාගෙන තිබුණු අතර, ඔහු සඳහා වෙන් කරන ලද කාලය වෙනුවෙන් අය විය යුතු රු.7000 ක කුලියද, අයකරගෙන නොතිබුණි. ඒ අනුව මෙම නිවසට අදාලව එකතුව රු.17,500 ක හිඟ නිවාස කුලියක් අය කර ගැනීමට පැවතුණි.	හිඟ කුලි කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු ය.	පිළිතුරු නොමැත.	ලබා	දී
(ඉ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක 28/49 දරන නිවාසය බාහිර පාර්ශවයන් වෙත ලබා දීමෙන් අනතුරුව නැවතත් 2023 පෙබරවාරි 01 දින වන විට රජයේ නිලධාරියෙකු වෙත ලබා දී තිබුණද, එහි ආර්ථික කුලිය	රජයේ නිවාස නියමිත කාලය තුල තක්සේරු කිරීමට කටයුතු කර තක්සේරු කුලිය අයකල යුතු ය.	පිළිතුරු නොමැත.	ලබා	දී

	තක්සේරු කර නොතිබුණ අතර 2021 වර්ෂයේදී රජයේ නිවාස තක්සේරු කරන අවස්ථාවේදී පදිංචිකරුවන් නොමැති වීම හේතුවෙන් ආර්ථික කුලිය තක්සේරු කර නොමැති අංක 64/4, සහ 28/52 දරන රජයේ නිවාස 2023 පෙබරවාරි 07 වන දින සිට නිලධාරීන් වෙත පදිංචිය සඳහා වෙන් කර තිබුණද, විගණන දිනය වූ 2025 ජනවාරි 30 දින වන විටත් ආර්ථික කුලිය තක්සේරු කර නොතිබුණි.		
(ඊ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවලට අදාලව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබූ 2021 නොවැම්බර් 11 දිනැති අංක MO/DS/EST/15/02/10 සහ 2022 ජනවාරි 12 දිනැති අංක MO/DS/EST/15/02/10 දරන තක්සේරු වාර්තා තක්සේරු කල දින සිට වර්ෂ තුනක කාලයක් සඳහා පමණක් වලංගු වන අතර, විගණන දිනය වූ 2025 ජනවාරි 30 දින වන විට එම තක්සේරු වාර්තා කල් ඉකුත් වී තිබුණද, නැවත තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.	රජයේ නිවාස නියමිත කාලය තුල තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය.	පිළිතුරු ලබා දී නොමැත.
(උ)	මොනරාගල අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා වෙන්කර තිබූ අංක PF – 8153 දරන වාහනය සඳහා 2024 වර්ෂය තුල රු. 707,175ක් වැයකර ඉන්ධන ලීටර් 2,175 ක් ලබාදී තිබුණු අතර, එම ඉන්ධන ලීටර් 2175 තුල ඇතුලත් ඇනවුම් මඟින් ලබාගත් ඉන්ධන ලීටර් 170ක ප්‍රමාණය හැර ඉතිරි ඉන්ධන ලීටර් 2005 ක වටිනාකම වන රු.650,065ක් අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කරන නිලධාරියාට		

දීමනාවක් ලෙස මුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 05 ඡේදය අනුව ඉන්ධන දීමනා සඳහා හිමිකම් ඇත්තා වූ තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක සේවයේ නියුක්ත නිලධාරියෙකු තම නිත්‍ය තනතුරට හිමි ඉන්ධන දීමනාව පමණක් ලබාගත යුතු අතර, අතිරේක තනතුරට අදාලව සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන විශේෂ රාජකාරි ගමන් සඳහා එකී තනතුරට හිමි ඉන්ධන දීමනාවට යටත්ව අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතියට යටත්ව ඉන්ධන දීමනා ලබාගත හැකිය. මෙම විධිවිධාන වලට අනුකූල නොවී අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරෙහි රාජකාරි ආවරණය කරන ප්‍රාදේශීය ලේකම්වරයෙකු නිත්‍ය තනතුරට හිමි මසකට ඉන්ධන ලීටර් 165 ක දීමනාවට අමතරව රාජකාරි ආවරණය කරනු ලබන තනතුරට හිමි මසකට ඉන්ධන ලීටර් 165 ක් බැගින් වූ සම්පූර්ණ ඉන්ධන දීමනාවද, එයට අමතරව අතිරේක ඉන්ධන දීමනා ලෙස තවත් ඉන්ධන ලීටර් 375 ක්ද, ලෙස 2024 වර්ෂය තුල රු.707,175 ක් වටිනාකමක් සහිත ඉන්ධන ලීටර් 2175 ක් ලබා ගෙන තිබුණි. තනතුරට හිමි ඉන්ධන දීමනාව පමණක් ලබා දීමට කටයුතු කල යුතු ය. ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 08/2021 හි සඳහන් පරිදි රාජකාරි ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් තනතුර සඳහා හිමි ඉන්ධන දීමනාවෙන් 50% ක ප්‍රමාණයක්, රාජකාරි ආවරණයකරනු ලබන නිලධාරියාට ලබා ගත හැකි අතර, ඊට අමතරව තවත් ඉන්ධන අවශ්‍ය වන්නේ නම් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියට යටත්ව අතිරේක ඉන්ධන ලෙස ලබා ගත හැක. කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඇති දුර සහ කැබ් රථයේ ඉන්ධන දහනය පිළිබඳ සලකා බලා සතියට ඉන්ධන ලීටර් 40 ක් අමතර ඉන්ධන වශයෙන් ලබා දීමට තීරණය කර ඇති බව.

(ii) 2019 මාර්තු 27 දිනැති අංක 08/2019 දරන ස්වදේශ කටයුතු වක්‍රලේඛය අනුව කිසියම් නිලධාරියෙකු හට විවිධ විෂයයන් යටතේ ලබා දෙන ඉන්ධනවල එකතුව ඔවුන්ගේ තනතුරට හිමි ඉන්ධන දීමනාවේ උපරිමයට වඩා වැඩි නොවිය යුතු වුවද, එයට අනුකූල නොවී අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන් එම තනතුරට හිමි මසකට ඉන්ධන ලීටර් 165 ක ප්‍රමාණයට අමතරව අවස්ථා 7කදී ඉන්ධන ලීටර් 375 ක් ලබා දී ඒ වෙනුවෙන් රු. 127,675 ක් ගෙවීම් කර තිබුණි.	වක්‍රලේඛය අනුව අදාළ තනතුරට හිමි ඉන්ධන දීමනාව පමණක් ලබා දීමට කටයුතු කල යුතු ය.	අතවශ්‍ය රාජකාරී සඳහා ඉන්ධන ලබා ගෙන ඇති අතර විවිධ වැය විෂයන් යටතේ ඉන්ධන වෙන් වී ඇති රාජකාරී සඳහා පමණක් එසේ ඉන්ධන ලබා ගෙන ඇති බව.
(iii) රාජකාරී ආවරණය සඳහා සති පදනමින් ඉන්ධන ලබා දී තිබුණු අතර කතරගම ඇසළ පෙරහැර සමයේ දෙවන හා තුන්වන සතිවලදී ප්‍රාදේශීය ලේකම්වරයා කතරගම තාවකාලික කඳවුරු කාර්යාලයේ සේවයේ යෙදී තිබුණද, අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කළ බව දක්වමින් එම කාල සීමාව සඳහා ඉන්ධන ලීටර් 80 ක් වෙනුවෙන් රු.25,360 ක දීමනාවක් ලබා දී තිබුණි.	ඇසළ පෙරහැර කාලය තුල ගෙවා ඇති දීමනාව අය කර ගත යුතු ය.	කතරගම පුද බිම වෙත පාද යාත්‍රාව මඟින් පැමිණෙන ජනතාව සඳහා පොදු පහසුකම් සැපයීම අධීක්ෂණය කිරීම අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධාන වගකීමක් වන බැවින් ඊට අදාළ රාජකාරී වෙනුවෙන් අදාළ සති 02 සඳහා ලබා ගත් ඉන්ධන භාවිතා කර ඇති බව.
(ඌ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් තුල 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී වන අලි ඇතුළු වන සතුන්ගෙන්, දේපල හානි 528 ක් ද, ශාරීරික හානි 32 ක් හා ජීවිත හානි 30 ක් වාර්තා වී තිබූ අතර ඒ	වන සතුන්ගෙන් සිදු වන හානි අවම කිරීම සඳහා විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කල යුතුය.	වන සතුන්ගෙන් වන හානි සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව රැස්වීම් 11ක් පවත්වා ඇති අතර මෙම තත්වය වැලැක්වීම සම්බන්ධයෙන් ජාතික

	සඳහා රු.52,619,280 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. වැල්ලවාය හා තණමල්විල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු වී ඇති දේපළ, ශාරීරික හා ජීවිත හානි ප්‍රමාණය සාපේක්ෂව ඉහල අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලසුම් සකස් කිරීමේදී, මෙම ගැටළුව විසඳීම සම්බන්ධයෙන් අදාල ආයතන සමඟ ඒකාබද්ධ වී ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.		ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව.
(එ)	මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශය විසින් වැඩිහිටි හා ආයතනගත නේවාසික දීමනා, අබාධිත දීමනා , වකුගඩු දීමනා , අස්වැසුම සහ සියවස් පූර්ණ දීමනා යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දීම සඳහා රු.951,198,069 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එයින් රු.30,727,337 ක් වූ ප්‍රතිපාදන නිසි අධ්‍යනයකින් තොරව ලබා ගැනීම සහ සුදුසු ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් ආපසු පවරාදී තිබුණි.	ලබා දී ඇති ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයන් යුතුව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු ය.	2024 වර්ෂයේ අවසන් කාර්තුවේදී පොරොත්තු ලේඛනයට නැවත ප්‍රතිලාභීන් ඇතුලත් කිරීම තාවකාලිකව නතර කල අතර, ඒ හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය දක්නට ලැබෙන අතර ඉදිරියේදී විධිමත්ව හා කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීමට කටයුතු කරන බව.
(ඒ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මධ්‍යම පාන්තික ගෘණුම් මිල මත බලපත්‍ර නිකුත් කල ප්‍රතිලාභීන් 04 දෙනෙකුගෙන් වාරික හා හිඟ පොලිය වශයෙන් රු.365,920ක් විගණන දිනය වූ 2024 නොවැම්බර් 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ වාරික හා පොලි මුදල් කඩිනමින් අයකර ගත යුතු ය.	මෙම දක්වා ඇති හිඟ මුදල් අයකරගැනීම සඳහා නැවත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බව.

(ඔ)	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත 2019 ඔක්තෝබර් 11 දින බලපත්‍ර අංක 4/10/5700 යටතේ රජයේ ඉඩමක් බදුකරුවෙකු වෙත බදු දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයවිය යුතු හිඟ බදු මුදල රු.1,960,000 ක් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 29 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ බදු මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු ය.	2020.10.08 දින බදුකරු අනතුරට ලක්වීම හේතුවෙන් ඔහු විසින් සිදු කරගෙන ගිය ව්‍යාපාරය දැනට වැසී ගොස් අදායම් මාර්ගද කිසිවක් නොමැති බැවින් බදු මුදල් ගෙවීමට නොහැකි බවට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව.
(ඕ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ලබා දී තිබූ ණය මුදල්වලින් මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක් වූ සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් ලෙස එකතුව නිලධාරීන් 18 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණයවල වටිනාකම රු.3,001,480 ක් වූ අතර එම ණය ශේෂය තුල වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින සේවක ණයවල වටිනාකම රු.1,413,451 ක් විය.	හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.	2024.12.31 දින වන විට මිය ගිය ,විශ්‍රාම ගිය,වැඩ තහනමට ලක් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් රජයට අය විය යුතු ණය ශේෂ වල වටිනාකම රු. 3,001,480ක් බව.

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ 2030 ට අනුව ලඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක කරා ලඟාවීමේ සුදානම පිළිබඳ පරීක්ෂාවේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය තුලදී නිසි අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර, වර්ෂය තුල තිරසර සංවර්ධන අරමුණු 01 ක් පමණක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව අරමුණු 16ක් කෙරෙහි නිසි අවධානය යොමුකර නොතිබුණි.	තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අවධානය යොමු කර නොමැති අරමුණුද හඳුනාගනිමින් ඒවාද ලඟා කර ගත හැකි පරිදි වාර්ෂික සැලසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.	මොණරාගල දිස්ත්‍රික්කයට අදාල කරගත හැකි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇති බව.

4.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්යසාධනය යටතේ සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යන අරමුණෙහි ප්‍රගතිය සියයට සියයක් බවට දක්වා තිබුණ ද, 2024 වර්ෂයේ අස්වැසුම ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් 54,638 ක් මොනරාගල දිස්ත්‍රික්කය තුළ සිටින බැවින් දුගී බව අවසන් කිරීමේ ප්‍රගතිය සියයට සියයක් ලෙස දැක්වීම නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය.	තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්යසාධනය නිවැරදිව දැක්විය යුතුය.	ප්‍රතිශතය ලෙස දක්වා ඇත්තේ හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම තුලින් සපුරාගත් ඉලක්කයන් වන අතර, ඉදිරියේදී මෙම ගණනය කිරීම් ප්‍රතිලාභීන්ගේ ආර්ථික ශක්තිමත්භාවය පිළිබඳවද සැලකිල්ලට ගෙන සකස් කිරීමේ ක්‍රමවේදයක් සම්බන්ධව සොයා බලා කටයුතු කරන බව

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකුගෙන්, සංවර්ධන නිළධාරීන් 05 ක් සහ කලමනාකරණ සේවා නිළධාරීන් 03 කගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සමන්විත වුවද සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණු අතර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා එක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකයෙන් අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමට කටයුතු කල යුතු ය.	2024 වර්ෂය තුළ ජාතික මට්ටමේ මැතිවරණ පැවැත්වූ අතර, අභ්‍යන්තර විගණන ශාඛාවේ කාර්ය මණ්ඩලයද මැතිවරණ රාජකාරි සඳහා කැඳවා තිබිණි. ඒ සඳහා මාස කිහිපයක් ගත වූ එයින් සාමාන්‍ය විගණන රාජකාරි සඳහා සැලකිය යුතු බාධාවක් එල්ල විය. ඒ අනුව 2024 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විගණන කටයුතු ඉටුකිරීම අසීරු වූ බව.
(ආ)	මුදල් රෙගුලාසි 133 (2) (අ) සහ (ආ) අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් සහ වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘතිවල ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් කටයුතු කිරීම අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධානම කාර්යය වුවද එම කාර්යය ඉටුකර නොමැති බව්ට නිරීක්ෂණය විය.	අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉටු කල යුතු කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කල යුතු ය.	එක් එක් ක්ෂේත්‍රයන්ට අදාලව අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කොට විගණන හා කළමනාකරණ කමිටුවල දී ඊට අදාල ඇගයීමක් ද සිදු කරන බව.

6. මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන කාර්ය මණ්ඩල විස්තරය අනුව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක අනුමත සේවක සංඛ්‍යාවෙන් විධායක ශ්‍රේණියේ තනතුරු 15 ක්, තෘතීයික ශ්‍රේණියේ තනතුරු 14 ක්, ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 119 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 2 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවති අතර ද්විතීයික ශ්‍රේණියේ සේවකයින් 210 ක අතිරික්තයක් විය.	පුරප්පාඩු තනතුරු පිරවීමට සහ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.	මේ සම්බන්ධයෙන් වන තොරතුරු වාර්ෂිකව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන බව.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/ සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථානමාරුවීම් ලබාදිය යුතු වුවද, මඩුල්ල,බුත්තල, බඩල්කුඹුර හා වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්ත නිලධාරීන් 282 දෙනෙකු 2024 නොවැම්බර් 08 දින වන විට වර්ෂ 06 සිට 31 දක්වා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටින බවට නිරීක්ෂණය විය.	උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/ සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම ස්ථානමාරුවීම් ලබාදිය යුතු ය.	2025 වර්ෂයේදී අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කල අතර, වාර්ෂිකව මෙම ක්‍රියාවලිය විධිමත්ම සිදු කිරීමට කටයුතු කරන බව.

(ඇ) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 තුල සිටින සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 633 ක් වූ අතර අනුමත සංඛ්‍යාව 452 ක් වූයෙන් සංවර්ධන නිලධාරීන් 181 කගේ අතිරික්තයක් පවතින බවට නිරීක්ෂණය විය.සිටින සංවර්ධන නිලධාරීන් 633 දෙනා සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද වැටුප් වියදම රු.502,527,235 ක් වූයෙන් අතිරික්ත සංවර්ධන නිලධාරීන් සඳහා ගෙවන ලද වැටුප් ඵලදායී නොවන වියදමක් බවට පත්ව තිබුණි.

අතිරික්ත සංවර්ධන නිලධාරීන්ගෙන් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකි වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුය.

නව තනතුරු අනුමත සේ සලකා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී තිබූ බැවින් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නව පත්වීම් ලබා දී මෙම දිස්ත්‍රික්කයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව.

බී.ජී. අසේල ඉදුනිල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (උඟව පළාත)
විගණකාධිපති වෙනුවට